28 DEC 1995

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ජූලි මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 ජූලි මස 07 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.55 යි

# 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1995 ජූලි මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 60/94

**ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීම සඳහා ද, ඒ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *(කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)*

## I වන කොටස

### ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීම සහ එහි සංයුතිය.

2. (1) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියක්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවනු ලැබිය යුතු ය. *(ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පිහිටුවීම.)*

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය මගින් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් නඩු පැවරීම ද, අධිකාරියට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කළ හැකි ය.

3. පහත දැක්වෙන කර්තව්‍ය අධිකාරියේ කර්තව්‍ය විය යුතු ය:— *(අධිකාරියේ කර්තව්‍ය.)*

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ මිනිස් බල අංශය විසින් හා වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන සෑම වෘත්තීය පුහුණු ව්‍යාපෘතියක් හෝ වැඩ සටහනක් ම දිගට ම කරගෙන යාම ;

(ආ) වෘත්තීය පුහුණුව සඳහා වැඩ සටහන් සකස් කිරීම සහ සේවා නියුක්තිය සඳහා අවශ්‍ය දක්ෂතා ලබා ගත හැකි වන පරිදි සුදුසුකම් ඇති තැනැත්තන්ට වෘත්තීය පුහුණුවක්, කෙළින් ම හෝ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ යම් නියෝජ්‍යායතනයක් මගින් ලබා දීම ;

(ඇ) ජාතික ශිල්පීය පරීක්ෂණ හා විභාග පැවැත්වීම සහ 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ සකස් කරන ලද සංවර්ධන සැලැස්මට අනුකූලව වෘත්තීය පුහුණුව ලබා ඇති තැනැත්තන්ට සහතික සහ වෙනත් ප්‍රදාන නිකුත් කිරීම ;

(ඈ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සහ වෘත්තීය පුහුණුව සංවර්ධනය කිරීම ;

2—ඩී35896—7,880 (95/06)

(ඉ) රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ නියෝජ්‍යායතන විසින් පවත්වා ගෙන යනු ලබන සියලු ම ආකාරයේ වෘත්තීය පුහුණු කටයුතු සම්බන්ධීකරණය කිරීම, පහසු කිරීම සහ ඒවාට සහාය වීම ;

(ඊ) වෘත්තීය පුහුණුවක් ලැබූ තැනැත්තන්ට, ඔවුන්ගේ හුරුකම් සහ නිපුණතා අනුව ජීවන මාර්ගයක් තෝරා ගැනීම හැකි කිරීම පිණිස ජීවන මාර්ග මාර්ගෝපදේශනය හා උපදේශන සේවා සැපයීම ;

(උ) වෘත්තීය පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති තැනැත්තන්ට හැකි අවස්ථාවල දී රැකියා ස්ථානගත සේවා ලබා දීම ;

(ඌ) ආර්ථිකයේ මිනිස් බල අවශ්‍යතා සහ රැකියා නිපුණතා සඳහා වූ ලේඛම සහ රැකියා අවස්ථා පිළිබඳව පර්යේෂණ කටයුතුවල නියුක්ත වීම ;

(එ) වෘත්තීය පුහුණුවට අදාළ සංවිධාන හා වැඩ සටහන් ඇති කිරීම ;

(ඒ) අන්තර් ජාතික වෘත්තීය පුහුණු සංවිධාන හා ආයතන සමග සම්බන්ධව බැඳීම් ඇති කර ගැනීම ;

(ඔ) රාජ්‍ය හා පෞද්ගලික අංශ විසින් වෘත්තීය පුහුණුව සඳහා අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පහසු කිරීම.

අධිකාරියේ බලතල.

4. (1) අධිකාරියේ කර්තව්‍ය සියල්ල ම හෝ ඉන් කිසිවක් ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා කිරීමට අධිකාරියට බලය තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් අධිකාරියට පැවරී ඇති බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කටයුතු කිරීමට අධිකාරියට බලය තිබිය යුතු ය :—

(අ) යම් නිශ්චිත ක්ෂේත්‍රයක වෘත්තීය පුහුණුව සඳහා මධ්‍යස්ථාන හෝ ආයතන පිහිටුවීම සහ ඒවා කළමනාකරණය කිරීම ;

(ආ) වෘත්තීය පුහුණුව සඳහා වූ යන්ත්‍ර හෝ අමු ද්‍රව්‍ය මිලදී ගැනීමෙහිලා හෝ වෙනත් යම් පහසුකම් සැපයීමෙහිලා මුදලින් හෝ අන්‍යාකාරයකින් සහාය වීම ;

(ඇ) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ වෘත්තීය පුහුණුවට අදාළ එවැනි යම් වැඩ සටහන් හෝ ක්‍රියාකාරකම් විෂයයෙහි සහභාගි වීම ;

(ඈ) විවිධ වෘත්තීය අභ්‍යාස පුහුණු ක්ෂේත්‍රවල පවත්වා ගෙන යනු ලබන ප්‍රමිති හා ලබා ඇති ප්‍රතිඵල කලින් කල තක්සේරු කිරීම හා අගැයීම ;

(ඉ) වෘත්තීය පුහුණුවෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා නව ශිල්පක්‍රම, තාක්ෂණ සහ උපකරණ හඳුන්වාදීම ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානවල හා ආයතනවල නිසි ප්‍රමිති පවත්වා ගෙන යනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීම සඳහා ඒ මධ්‍යස්ථාන හා ආයතන පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම ;

(උ) අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා සලසන ලද හෝ සපයන ලද පහසුකම් හෝ උපකරණ වෙනුවෙන් ගාස්තු හෝ වෙනත් අය කිරීම් නියම කිරීම හා අය කිරීම ;

(ඌ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට ගැනීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(එ) අධිකාරියේ අභ්‍යාසලාභීන්, නිලධරයන් හා සේවකයන් සඳහා මුදල් ආධාර, ශුභ සාධන හා විනෝද පහසුකම්, ගෙවල් සහ වෙනත් ඉඩකඩ සැපයීම ;

(ඒ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙළින් ම හෝ අධිකාරිය විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළුවීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඔ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් සහ එහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය සහ ඔවුන්ට නිවාඩු ප්‍රදානය කිරීම ඇතුළුව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළව රීති සෑදීම ;

(ක) අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ අභ්‍යාසලාභීන්ට වෘත්තීය පුහුණුව සැපයීම සඳහා සේවා යෝජකයන් සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(ග) අභ්‍යාසලාභියකුට වෘත්තීය පුහුණුව සැපයීමේ කාර්යය සඳහා යොදවා ගැනීමට අධිකාරිය විසින් අදහස් කරනු ලබන සෑම සේවා යෝජකයකු ම, ඒ පුහුණුවට ප්‍රථමයෙන් ඒ අභ්‍යාසලාභියා සමග වෘත්තීය අභ්‍යාස ගිවිසුමකට ඇතුළත් වන බවට සහ ඒ ගිවිසුම අධිකාරිය වෙත ලියාපදිංචි කරන බවට වගබලා ගැනීම.

අධිකාරියේ සංයුතිය.

5. (1) අධිකාරිය, පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හය දෙනෙක්; ඒ සාමාජිකයන්ගෙන් හතර දෙනකු පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් අතුරින් විය යුතු ය ;

මේ ඡේදය යටතේ පත් කරනු ලබන සාමාජිකයකු, මෙහි මින් මතු "පත් කළ සාමාජිකයකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(ආ) යෞවන කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඇ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඈ) කර්මාන්ත සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඉ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) කම්කරු කොමසාරිස්වරයා වශයෙන් නත් කාලයෙයි ධුර දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ;

(උ) 1990 අංක 20 දරන තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ සභාපතිවරයා හෝ ඔහුගේ නියෝජිතයා.

(2) අමාත්‍යවරයා විසින් අධිකාරියේ සාමාජිකයන් අතුරින් දෙදෙනකු, පිළිවෙලින් අධිකාරියේ සභාපතිවරයා හා උප සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුතු අතර, එසේ නම් කරනු ලබන සාමාජිකයන් මෙහි මින් මතු පිළිවෙලින් "සභාපතිවරයා" සහ "උප සභාපතිවරයා" වශයෙන් සඳහන් කරනු ලැබේ.

(3) සභාපතිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාලය.

6. (1) සෑම පත් කළ සාමාජිකයකු ම, ඔහු ධුරයෙන් ඉල්ලා අස් වුවහොත්, ඉවත් කරනු ලැබුවහොත් හෝ අන්‍යාකාරයකින් ධුරය හිස් කළහොත් මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය.

(2) පත් කළ සාමාජිකයකු විසින්, තමා ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(3) රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් හේතුවක් නිසා තම ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන්නේ නම් අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු කිසිවක් නොදක්වා ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඉන් අනතුරුව ඒ සාමාජිකයා ධුරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) ඉල්ලා අස්වීම, ඉවත් කරනු ලැබීම හෝ අන්‍යාකාරයකින් යම් පත් කළ සාමාජිකයකු ධූරය හිස් කරන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

(6) කාලය ඉකුත්වීම නිසා ධූරය හිස් කරන සාමාජිකයකු, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

සභාපතිවරයා සහ උප සභාපතිවරයා.

7. (1) අධිකාරියේ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, සභාපති ධූරයෙන් හෝ උප සභාපති ධූරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති හෝ උප සභාපති ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(2) සභාපතිවරයා හෝ උප සභාපතිවරයා සභාපති ධූරයෙන් හෝ උප සභාපති ධූරයෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ඒ සඳහා හේතු කිසිවක් නොදක්වා අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා සභාපති හෝ උප සභාපති ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත් ව, සභාපතිවරයාගේ හා උප සභාපතිවරයාගේ ධූර කාලය ඔවුන් අධිකාරියේ සමාජිකත්වය දරන කාලය විය යුතු ය.

අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කරනු ලැබීමට නුසුදුසුකම්

8. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකුව සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්

ඒ තැනැත්තා, අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

අමාත්‍යවරයා විසින් දෙනු ලබනු විධාන.

9. අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ එහි කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන අධිකාරියට දෙනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

අධිකාරියේ කටයුතු පිළිබඳව විමර්ශනය කරන ලෙස නියම කිරීමට අමාත්‍ය වරයා සතු බලය.

10. අධිකාරියේ කටයුතු සියල්ල ම හෝ එහි යම් කටයුත්තක් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් මගින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍ය වරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි යම් නියමයක් කල විට, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලසීම සහ සියලු තොරතුරු සැපයීම අධිකාරිය විසින් කළ යුතු ය.

යම් පුරප්පාඩු වක් තිබීමේ හේතුවෙන් ක්‍රියා බලරහිත නොවිය යුතු බව.

11. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද, අධිකාරියට ක්‍රියා කළ හැකි අතර, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් අධිකාරියේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

12. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නියම කරනු ලබන යම් ආකාරයකින් හා එසේ නියම කරනු ලබන අනු ප්‍රමාණ අනුව අධිකාරියේ සියලු සාමාජික යන්ට හෝ යම් සාමාජිකයකුට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ රැස්වීම.

13. (1) යටත් පිරිසෙයින් සෑම මාසයක ම එක් වරක් හෝ අධිකාරියේ රැස්වීම් පවත්වනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ අනිකුත් විධිවිධානවලට යටත්ව, අධිකාරියේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් අධිකාරිය විසින් එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව.

14. (1) අධිකාරියේ මුද්‍රාව, අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තිබිය යුතු ය.

(2) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් අධිකාරියේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, අධිකාරියේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර. ඒ සාමාජිකයන් දෙදෙනා ම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ මුද්‍රාව තබනු ලැබූ සාධන පත්‍රවල හෝ ලේඛනවල නාමලේඛනයක් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු ය.

වෘත්තීය පුහුණු සභාව

15. (1) යම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් හෝ කාර්මික ආයතනයක් හෝ යම් වෘත්තීය පංතියක් හෝ කණ්ඩායමක් සඳහා හෝ යම් වෘත්තීය පුහුණුවක් හා සම්බන්ධ යම් නියමිත කාරණයක් සඳහා, අමාත්‍යවරයා විසින් (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීය පුහුණු සභාවක් පත් කරනු ලැබිය හැකි ය.

(2) එක් එක් සභාව සඳහා සභාපතිවරයකු ද, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් සාමාජිකයන් සංඛ්‍යාවක් ද, අමාත්‍යවරයා විසින් පත් කරන ලැබිය හැකි ය. සභාවේ බලතල, කර්තව්‍ය හා කාර්ය නියමිත පරිදි විය යුතු ය.

(3) සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික ද ඇතුළුව, සභාව පරිපාලනය කිරීම හා සම්බන්ධ වියදම් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතු ය.

## II වන කොටස

## අධිකාරියේ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය.

16. (1) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අධිකාරිය සලකන යම් නිලධරයන් හා සේවකයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, අධිකාරිය විසින්—

(අ) එසේ පත් කරන ලද නිලධරයන් හා සේවකයන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම;

(ආ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම;

(ඇ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම;

(ඈ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රතිලාභය සඳහා අර්ථසාධක අරමුදලක් හෝ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් පිහිටුවා විධිමත් කිරීම හා ඒ අරමුදලට හෝ යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවීම

කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් සියලු ම කාරණා සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

රජයේ සේවයේ නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

17. (1) අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින්, එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයකට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත ඒ සාමාජිකයා, නිලධරයා හෝ සේවකයා ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

අධිකාරියේ නිලධරයන්ට හෝ සේවකයන්ට බලතල, කර්තව්‍ය හා කාර්ය පැවරීම.

18. අධිකාරිය විසින් මේ වගන්තියෙන් අධිකාරිය වෙත පැවරී ඇති බලය හැර, එහි කර්තව්‍ය හා බලතල අතුරින් යම් කර්තව්‍යයක් හෝ බලයක් අධිකාරියේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පවරා දෙනු ලැබිය හැකි අතර, එවැනි යම් කර්තව්‍යයක් හෝ බලයක්, අධිකාරියේ විශේෂ හෝ සාමාන්‍ය විධිවිධානවලට යටත්ව ඒ නිලධරයා හෝ සේවකයා විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතු ය.

## III වන කොටස

## වෘත්තීය පුහුණු සංවර්ධන අරමුදල

අධිකාරිය සතු ණයට ගැනීමේ බලතල.

19. මේ පනත යටතේ අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා අධිකාරියට අවශ්‍ය විය හැකි මුදල්, අධිකාරිය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හෝ එවැනි ම එකඟත්වය ඇතිව දෙනු ලැබූ යම් පොදු බලයක කොන්දේසිවලට අනුකූලව අයිරාවක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් යම් මුදල් ණයට ගැනීම හෝ ණයට ගැනීමේ කොන්දේසි මත යම් මුදල් සාකච්ඡා කොට ලබාගැනීම හෝ කළ හැකි ය :

එසේ වුවද, මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ණයට ගන්නා ලද යම් මුදලක් සම්බන්ධයෙන් ගෙවීම හිඟව ඇති මුළු මුදල, කිසිම අවස්ථාවක දී මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් නොඉක්මවිය යුතු ය.

වෘත්තීය පුහුණු සංවර්ධන අරමුදල.

20. (1) මෙහි මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන 'වෘත්තීය පුහුණු සංවර්ධන අරමුදල' යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ඒ අරමුදලට—

(අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ මිනිස් බල අංශයේ සහ වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනයේ බැරට ඇති සියලු මුදල් ;

(ඇ) මේ පනත යටතේ අධිකාරිය විසින් සපයනු ලබන වෘත්තීය පුහුණුව හෝ සේවා සම්බන්ධයෙන් ගාස්තු හා අය කිරීම් වශයෙන් එකතු කරනු ලබන සියලු මුදල් ;

(ඈ) ප්‍රදාන හෝ තෑගි වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ;

(ඉ) මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන වෙනත් සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

21. මේ පනත යටතේ අධිකාරිය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ මේ පනත මගින් හෝ මේ පනත යටතේ ගෙවීමට නියමිත හෝ බලය දෙන ලද සියලු මුදල්, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පුහුණු දීමනාව.

22. (1) වෘත්තීය පුහුණුව ලබන සෑම අභ්‍යාසලාභියකුටම අරමුදලින් පුහුණු දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, අමාත්‍යවරයා විමසා, අභ්‍යාසලාභීන්ට දීමනාව වශයෙන් ගෙවිය යුතු මුදල නිශ්චය කරනු ලැබිය යුතු ය. යම් යම් ගණවල අභ්‍යාසලාභීන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා නිපුණතා සැලකිල්ලට ගෙන, විවිධ ගණවලට අයත් අභ්‍යාසලාභීන් සම්බන්ධයෙන් විවිධ දීමනා ගෙවීමට එසේ නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරිය විසින් පිළිගනු ලැබූ යම් ආයතනයක පුහුණුව ලබන අභ්‍යාසලාභියකු, ඒ ආයතනයේ අභිමතය පරිදි,—

(ඉ) ඔහුට අරමුදලින් ලැබෙන දීමනාවට වැඩියෙන් හෝ ඒ දීමනාව ඉක්මවන යම් ගෙවීමක් ඔහුගේ සේවා යෝජකයෙන් ලබා ගැනීමට හිමිකම් ලැබිය හැකි ය;

(ආ) ඔහුගේ සේවා යෝජක සඳහා ඔහු විසින් කරනු ලබන කැලි ප්‍රමාණයේ යම් වැඩක් සම්බන්ධයෙන්, ඔහුට අරමුදලින් ලැබෙන දීමනාවට වැඩියෙන් හෝ ඒ දීමනාව ඉක්මවන, යම් ගෙවීමක් ඔහුගේ සේවා යෝජකයෙන් ලබා ගැනීමට හිමිකම් ලැබිය හැකි ය;

(ඇ) ඒ ආයතනයේ වෙනත් කම්කරුවන්ට ගෙවන ප්‍රසාද මුදලක් හෝ දිරි දීමනාවක් වශයෙන් වූ යම් ගෙවීමක් ඔහුගේ සේවා යෝජකයෙන් ලබා ගැනීමට හිමිකම් ලැබිය හැකි ය.

1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන අභ්‍යාසලාභීන්ට අදාළ නොවිය යුතු බව.

23. නියමිත දිනයේ සිට හා ඉන් පසුව, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ සහ 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන, අධිකාරිය විසින් වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගනු ලැබූ අභ්‍යාසලාභීන් කෙරෙහි අදාළ නොවිය යුතු ය.

අධිකාරියේ මුදල් වර්ෂය.

24. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

අධිකාරියේ ගිණුම් විගණනය කිරීම.

25. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අධිකාරියේ ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

තොරතුරු ඉල්ලා සිටීමට අධිකාරියට ඇති බලය.

26. අධිකාරිය විසින් හෝ තත් කාර්යය සඳහා අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ අධිකාරියේ යම් නිලධරයකු විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් මේ පනත යටතේ වූ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම හා කර්තව්‍ය ඉටු කිරීම අධිකාරියට හැකි වීම පිණිස යම් තැනැත්තකුගේ දැනීම ඇතුළත වූ ද, ඒ දැන්වීමෙහි සඳහන් යම් කාර්යයකට අදාළ වූ ද, සියලු තොරතුරු, ඒ දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත අධිකාරිය වෙත හෝ ඒ නිලධරයා වෙත සපයන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

රජයේ දේපළ භිවිසුම් හෝ බැරකම් අධිකාරියට පැවරීම.

27. (1) මෙහි මින් මතු සඳහන් කර ඇති විධිවිධානවලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්—

(අ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය රජයේ යම් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් හෝ යම් කාර්මික ආයතනයක් හෝ යම් චංචල හෝ නිශ්චල දේපළක්; සහ

(ආ) අධිකාරියේ කර්තව්‍ය අතරින් යම් කර්තව්‍යයක් හා සම්බන්ධ යම් හිමිකමක් හෝ බැරකමක්

අධිකාරියට පවරනු ලැබිය හැකි ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව රජයේ කිසිම චංචල දේපළක්, ගිවිසුමක් හෝ බැරකමක් (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය වෙත පවරනු නොලැබිය යුතු ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ සහ රජයේ ඉඩම් පිළිබඳ විෂයය තත් කාලයෙහි පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, රජයේ කිසිම නිශ්චල දේපළක් (1) වන උපවගන්තිය යටතේ අධිකාරියට පවරනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු ඒ නියමයේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි—

(අ) ඒ නියමයෙහි සඳහන් දේපළ, අධිකාරිය සතු විය යුතු අතර, ඒවා අධිකාරියේ දේපළ විය යුතු ය;

(ආ) ඒ නියමයෙහි සඳහන් ගිවිසුම්, අධිකාරියේ ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ ගිවිසුම් යටතේ පවත්නා රජයේ සියලුම අයිතිවාසිකම් හා බැඳීම් අධිකාරියේ අයිතිවාසිකම් හා බැඳීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඇ) ඒ නියමයෙහි සඳහන් බැරකම්, අධිකාරියේ බැරකම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

28. අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ ඉඩම් නොවන යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් විෂයයෙහි වූ යෝජිත අත්කර ගැනීම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් එසේ පළ කරනු ලැබූ අවස්ථාවක, නියමයේ සඳහන් ඉඩම හෝ යම් ඉඩමක සම්බන්ධතාව, පොදු කාර්යයක් සඳහා අවශ්‍ය වී ඇති ලෙස සලකනු ලැබ (460 වන අධිකාරය වන) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය. තව ද, එසේ අත්කර ගනු ලැබූ විට, ඒ ඉඩම හෝ සම්බන්ධතාව ඒ පනත යටතේ අධිකාරිය වෙත පවරනු ලැබිය යුතු ය.

අනිවාර්යයෙන් ඉඩම් අත්කර ගැනීමට ඇති බලය.

29. අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන, ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

30. අධිකාරියේ සියලුම සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

31. (1) අධිකාරියේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(2) මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය මත හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙන එන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ වියදම, ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගෙන ඇත්නම් මිස, හා ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරනහොත් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

32. නියමිත දිනයේ සිට හා ඉන්පසුව —

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ මිනිස් බල අංශය හා වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය විසින් ඉටු කරනු ලැබූ වෘත්තීය පුහුණුවට අදාළ සියලු කර්තව්‍ය නියමිත දිනයේ සිට අධිකාරිය විසින් ඉටු කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) මිනිස් බල අංශයේ සහ වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනයේ සියලු චංචල හා නිශ්චල දේපළ ද, මිනිස් බල අංශය හා වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය විසින් ඇතුළත් වනු ලැබ නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ පවත්නා සියලු ගිවිසුම් ද, නියමිත දිනයේ සිට අධිකාරිය වෙත පැවරී සතු විය යුතු ය.

ඉතිරි කිරීම.

33. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද—

(අ) යම් අභ්‍යාසලාභියකු සමඟ රජය විසින් මිනිස් බල අංශය සහ වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය වෙනුවෙන් ඇතුළත් වනු ලැබ, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ පවත්නා සෑම පුහුණුවීමේ ගිවිසුමක් නියමිත දිනයේ සිට අධිකාරිය විසින් මේ පනත යටතේ ඒ අභ්‍යාසලාභියා සමඟ ඇතුළත් වන ලද ගිවිසුමක් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ආ) මිනිස් බල අංශය සහ වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය විසින් සාදනු ලැබ හෝ නියම කරනු ලැබ, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ පවත්නා සියලු රීති හෝ පුහුණුවීමේ ප්‍රමිති, නියමිත දිනයේ සිට මේ පනත යටතේ සාදනු ලැබූ රීති හා නියම කරන ලද ප්‍රමිති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

නියෝග.

34. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ ප්‍රතිපත්ති බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුනු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, පහත සඳහන් කාරණා සියල්ල ම හෝ ඉන් යම්කිසි කාරණයක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) විවිධ වෘත්තිය පුහුණු ක්ෂේත්‍රවල අභ්‍යාසලාභීන් වශයෙන් තෝරා ගනු ලැබීම සඳහා තිබිය යුතු අධ්‍යාපන සහ ශාරීරික යෝග්‍යතා ප්‍රමිති ;

(ආ) අභ්‍යාසලාභීන් සහ ඔවුන් වෘත්තීය පුහුණුව ලබන ව්‍යාපාර හෝ ආයතන අතර වූ පුහුණු කිරීමේ ගිවිසුම්වල ඇතුළත් කරනු ලැබිය යුතු නියම හා කොන්දේසි ;

(ඇ) විවිධ වෘත්තිය පුහුණු ක්ෂේත්‍රවල අභ්‍යාසලාභීන් සඳහා වූ පුහුණුවීමේ කාලය ;

(ඈ) විවිධ වෘත්තිය පුහුණු ක්ෂේත්‍රවල අභ්‍යාසලාභීන් විසින් ලැබිය යුතු ප්‍රායෝගික පුහුණුවීම් සහ ආයතනික පුහුණුවීම් වර්ග;

(ඉ) මේ පනත යටතේ වෘත්තීය පුහුණුව භාරගන්නා ව්‍යාපාර හෝ ආයතන සතු බැදීම්;

(ඊ) මේ පනත යටතේ වෘත්තීය පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සතු බැදීම් ;

(උ) මේ පනත යටතේ වෘත්තීය පුහුණුව ලබන අභ්‍යාසලාභීන් ගේ වැඩ කරන වේලාවන් සහ නිවාඩු හිමිකම් ;

(ඌ) නියමිත යයි මේ පනතින් නියම කර ඇති සියලු කාරණා.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ ඒ නියෝග යෙහි සඳහන් යම් පසු දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

35. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

36. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය" යන්නෙන්, කම්කරු දෙපාර්තමේන්තුවේ වැඩ මූලිකයන් පුහුණු කිරීමේ ආයතනය අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියක්න් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"මිනිස් බල අංශය" යන්නෙන්, කම්කරු දෙපාර්තමේන්තුවේ මිනිස් බල අංශය අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියමිත බව අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;

"වෘත්තිය පුහුණුව" යන්නෙන්, පාරිශ්‍රමික ගෙවනු ලබන සේවා නියුක්තිය සඳහා නිපුණතා විධිමත් පරිදි දියුණු කිරීම අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.